**කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය, දෙවන වසර (මාර්ගගත) – 2021**

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය II**

(පැය තුනයි)

මුළු ප්‍රශ්න ගණන: 06

**පළමු ප්‍රශ්නයද ඇතුළුව** ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

1. රාවණා යනු පර්ල් හි අගනුවර වන ඩයමන්ඩ් මහ නගර සභාවේ (MC) නගරාධිපතිවරයා වේ. 2021 ජූලි මාසයේදී, වෙළඳ සංගමයේ සභාපති වන දිසාලා, රාවණා සමඟ උණුසුම් වචන හුවමාරුවක් ඇති වී තිබුනි. මාධ්‍යවේදිනියක් වන රාජිනී මෙම සිදුවීම පුවත්පතක වාර්තා කළාය. මාධ්‍ය හමුවකදී රාවණා කියා සිටියේ ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම පරිදි ප්‍රජා මධ්‍යස්ථානයක් පිහිටුවීමට මහ නගර සභාව (MC) අදහස් කරන බවයි. හදිසි අවස්ථා වලදී ආහාර, නවාතැන් සහ අනෙකුත් මූලික සැපයුම් වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මෙම මධ්‍යස්ථානය මගින් සපයනු ලබන බව ඔහු වැඩිදුරටත් පැවසීය.

   මහ නගර සභාව (MC) විසින් සම්මත කරන ලද අනු නීතියක් මගින් පුද්ගලික අයිතිය සහිත ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා ප්‍රතිපාදන සපයයි. අනු නීතියේ සඳහන් වන්නේ 'ප්‍රජා ක්‍රියාකාරකම්වලට අදාළ ඕනෑම කටයුත්තක් සඳහා නගර සභාවට ඕනෑම පෞද්ගලික ඉඩමක් තාවකාලිකව හෝ ස්ථිරව අත්පත් කර ගත හැකිය' යනුවෙනි. 2021 සැප්තැම්බර් මාසයේදී, මහ නගර සභාව (MC) විසින් මෙම නීතිය යටතේ දිසාලාට සහ රාජිනීට අයත් ඉඩම ද ඇතුළුව පුද්ගලික අයිතිය සහිත ඉඩම් කිහිපයක් අත්පත් කර ගන්නා ලදී. ඔවුන්ගේ දේපල අගනුවරට ආසන්නව පිහිටා ඇත. මධ්‍යම රජය විසින් සම්මත කරන ලද නීතියකින්, 'පළාත් පාලන ආයතන විසින් අත්පත් කර ගන්නා ඕනෑම පෞද්ගලික ඉඩමක් පොදු කටයුතු සඳහා පමණක් භාවිත කළ යුතුය' යනුවෙන් දක්වා ඇත.

   පසුව, ඉහළ මිලකට කුලියට දීම සඳහා සාප්පු සංකීර්ණ සහ විනෝදාස්වාද ස්ථාන පිහිටුවීම සඳහා නගර මධ්‍යස්ථානයක් (City Centre) ඉදිකිරීමට මහ නගර සභාව (MC) අදහස් කරන බව සොයා ගන්නා ලදී. දිසාලා සහ රාජිනී මහ නගර සභාව (MC) විසින් සාදන ලද අනු නීතියේ වලංගුභාවය අභියෝගයට ලක් කිරීමට බලාපොරොත්තු වෙති. ඔවුන් වැඩිදුරටත් කියා සිටින්නේ එහි බලය අයුතු ලෙස භාවිත කිරීම හේතුවෙන් ඩයමන්ඩ් මහ නගර සභාව විසුරුවා හැරිය යුතු බවයි.

   පර්ල් හි පළාත් පාලන ආයතන සම්බන්ධ නීති පද්ධතිය ශ්‍රී ලංකාවට සමාන යැයි උපකල්පනය කරන්න. දිසාලාට සහ රාජිනීට උපදෙස් දෙන්න.

2. ෆෙඩරල් ව්‍යවස්ථා ආයතනික සැලසුම මගින් කේන්ද්‍රාභිසාරී(Centripetal) සහ කේන්ද්‍රාපසාරී(Centrifugal) බල තුලනය කරයි. මෙහි ප්‍රතිඵලය වන්නේ ෆෙඩරල් ව්‍යුහවල විවිධත්වයට අනන්‍ය ලක්ෂණ ඇසුරින් එක් එක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අතිශෝක්තියෙන් වර්ණනා කිරීමයි. කෙසේ වෙතත්, විවිධ ආයතනික ක්‍රියාකාරීන් ව්‍යවස්ථාමය ප්‍රතිපාදන

ප්‍රායෝගිකව අර්ථකථනය කර බලාත්මක කරන ආකාරය මත පදනම්ව ෆෙඩරල්වාදයේ නියම ස්වභාවය ද වෙනස් විය හැකිය.

ඔබ කැමති අධිකරණ බල ප්‍රදේශ දෙකක ෆෙඩරල් ව්‍යුහයන් සංසන්දනය කරමින් මෙම ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

3. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වැනි සංශෝධනයේ අධිකරණ අර්ථනිරූපණය රාජ්‍යයේ ඒකීය ස්වභාවය සහ ජනතා පරමාධිපත්‍යය පිළිබඳ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන මගින් බලපෑමට ලක් වී තිබේ. නිදහසින් පසු කාලපරිච්ඡේදයේ බලය බෙදා හදා ගැනීම සඳහා වාර්ගික සුළුතරයන්ගේ අරගල සම්බන්ධයෙන් අධිකරණමය ප්‍රවේශය මෙම විධිවිධාන අර්ථනිරූපණය කෙරෙහි තවදුරටත් බලපෑම් කර තිබේ.

ඔබ එකඟ වන්නේද? දහ තුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ (1987) බහුතර මතය සහ විරුද්ධ මතයන් සැලකිල්ලට ගනිමින් ඉහත ප්‍රකාශය ඇගයීමට ලක් කරන්න.

4. බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩුකාරවරයාට(WPC) සභාවේ අයථා පරිපාලනය සම්බන්ධයෙන් පැමිණිලි කිහිපයක් ලැබී ඇත. මේ අනුව, ආණ්ඩුකාරවරයා විසින් බස්නාහිර පළාත් සභාවේ (WPC) ප්‍රධාන අමාත්‍යවරයා වෙත ලිපියක් යවා සභාව විසුරුවා නොහැරිය යුත්තේ මන්දැයි හේතු විමසීය. විසුරුවා හැරීමට එරෙහිව මහ ඇමැතිවරයා ආණ්ඩුකාරවරයාට උපදෙස් දුන්නේය. පසුව, ආණ්ඩුකාරවරයා එම කාරණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගෙන් උපදෙස් ඉල්ලා සිටියේය. බස්නාහිර පළාත් සභාවේ (WPC) ප්‍රධාන අමාත්‍යවරයාට එහි සාමාජිකයින් බහුතරයකගේ සහයෝගය හිමි වුවද, විසුරුවා හැරීමට පක්ෂව ජනාධිපතිවරයා ඔහුට උපදෙස් දුන්නේය. පසුදින, මාධ්‍ය හමුවකදී, ආණ්ඩුකාරවරයා ප්‍රකාශ කළේ ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි පාර්ලිමේන්තු මන්ත්‍රී මණ්ඩලය විසුරුවා හැරීමට අදහස් කරන බවයි. එම තීන්දුව අධිකරණ විමර්ශනයට ලක් කළ නොහැකි බවද ආණ්ඩුකාරවරයා වැඩිදුරටත් ප්‍රකාශ කළේය. බස්නාහිර පළාත් සභාව(WPC) විසුරුවා හැරීමේ බලය ක්‍රියාත්මක කිරීම කාර්ය පටිපාටික අවශ්‍යතාවලට යටත් බව ප්‍රධාන අමාත්‍යවරයාගේ අදහස විය. පසුව ප්‍රධාන අමාත්‍යවරයා බස්නාහිර පළාත් සභාවේ (WPC) සාමාජිකයින් සමඟ සාකච්ඡා කර ආණ්ඩුකාරවරයාව ධුරයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට තීරණය කළේය.

ආණ්ඩුකාරවරයාගේ සහ ජනාධිපතිවරයාගේ ක්‍රියාවන් හි සහ තීරණයන්හි ව්‍යවස්ථාමය වලංගුභාවය සහ යෝග්‍යතාව අදාළ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරින් සාකච්ඡා කරන්න.

5. මහනුවර ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ පළාත් පාසලක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දැන්වීමක් ප්‍රකාශයට පත් කරන ලදී. අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් විරෝධතා මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලෙසට පසුව දැනුම්දීමක් නිකුත් කරන ලදී. මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා කියා සිටියේ අධ්‍යාපන විෂය සහ අධ්‍යාපනික ගොඩනැගිලි සහ ක්‍රීඩා පිටි ඉදිකිරීම හා නඩත්තු කිරීම පළාත් සභාවලට පවරා ඇති කරුණු බවයි. මහනුවර ප්‍රාදේශීය ලේකම්වරයාගේ ක්‍රියාකලාපය අභියෝගයට ලක් කරමින් පළාත්බද මහාධිකරණයේ නඩුවක් ගොනු කිරීමට ප්‍රධාන අමාත්‍යවරයා තීරණය කරයි. මේ අතර, සියලුම රජයේ සහ අර්ධ රාජ්‍ය පාසල් සඳහා අදාළ වන අධ්‍යාපනික ගොඩනැගිලි සහ ක්‍රීඩා පිටි ඉදිකිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් මධ්‍යම රජය ප්‍රතිපත්තියක් නිකුත් කළේය.

ඉහත තත්ත්වය අනුව පළාත් සභාවල ව්‍යවස්ථාදායක අධිකාරියේ විෂය පථය සහ පළාත්බද මහාධිකරණයේ අධිකරණ බලය සම්බන්ධයෙන් මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා ඔබේ උපදෙස් පතයි. ප්‍රධාන අමාත්‍යවරයාට උපදෙස් දෙන්න. අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන, පාර්ලිමේන්තු පනත් සහ නඩු තීන්දු ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

6. වෛද්‍ය රාජේන්ද්‍ර ආයුර්වේද වෛද්‍යවරයෙකි. වසර කිහිපයක් ඔහු උතුරු-මැද පළාතේ පළාත් සෞඛ්‍ය කාර්යාලයට අනුබද්ධ කොමසාරිස්වරයෙකු ලෙස සේවය කළේය. අනුයුක්තයක් මත ඔහු කොවිඩ් 19 ආසාදිත පුද්ගලයන් අතර ප්‍රතිශක්තිය වැඩි දියුණු කිරීමේ වැඩසටහනක ප්‍රධාන සම්බන්ධීකාරක ලෙස බස්නාහිර පළාතේ පළාත් සෞඛ්‍ය කාර්යාලයට පත් කරන ලදී. බස්නාහිර පළාත් කාර්යාලයේ සේවය කරමින් සිටියදී, කෝමාරිකා සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීමට ප්‍රතිචාර වශයෙන් වැඩිම ලංසුව තැබූ සැපයුම්කරු තෝරා ගැනීමට, ප්‍රධාන අමාත්‍යවරයා වෛද්‍ය රාජේන්ද්‍ර මහතාට බලපෑම් කළේය. කෙසේ වෙතත්, වෛද්‍ය රාජේන්ද්‍ර තෝරා ගත්තේ අඩුම ලංසුව තැබූ සැපයුම්කරුය.

ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි වෛද්‍ය රාජේන්ද්‍ර මහතාව පළාතේ දුෂ්කර ප්‍රදේශයකට මාරු කරන ලෙස ආණ්ඩුකාරවරයා බස්නාහිර පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නියෝග කළේය. ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා නව ප්‍රධාන සම්බන්ධීකාරකවරයකු පත් කරන ලෙසද ඔහු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට වැඩිදුරටත් උපදෙස් දුන්නේය. ඒ අනුව කොමිසම විසින් නව ප්‍රධාන සම්බන්ධීකාරක ලෙස වෛද්‍ය නිර්මලී පත් කරනු ලැබේ. පත්කිරීම සිදුකිරීමේදී, එම තනතුර සඳහා මනා සුදුසුකම් ඇති වෛද්‍ය නාලනිව කොමිසම නොසලකා හරියි. වෛද්‍ය නිර්මලී පත්කිරීමේදී ආණ්ඩුකාරවරයා සහ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තම බලතල ඉක්මවා කටයුතු කර ඇති බවට ඇය මහ ඇමතිවරයාට පැමිණිලි කරයි. වෛද්‍ය නිර්මලී බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයකුගේ ලේලියකි.

මේ අතර වෛද්‍ය රාජේන්ද්‍ර මහතා එම ස්ථාන මාරුව භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත. බස්නාහිර පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් සේවයට තමා අයත් නොවන බව පවසමින් ආණ්ඩුකාරවරයාගේ තීරණය නීති විරෝධී බව ඔහු කියා සිටී. ඔහු තවදුරටත් තර්ක කරන්නේ තමා ඇත්ත වශයෙන්ම උතුරුමැද පළාතේ පළාත් රාජ්‍ය සේවයට අයත් බවත් දැනට බස්නාහිර පළාතේ සේවය කරන්නේ අනුයුක්තයක් මත පමණක් බවත්ය.

ආණ්ඩුකාරවරයාගේ සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ අභියෝගයට ලක් කිරීම සම්බන්ධයෙන් වෛද්‍ය රාජේන්ද්‍ර සහ වෛද්‍ය නාලනී වෙත උපදෙස් දෙන්න. නඩු තීන්දු ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

*********************